# ලක්දිව භික්ෂු උරුමය




පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

**මහාචාර්ය අනුරාධ සෙනවිරත්න විසිනි**

# ලක්දිව භික්ෂු උරුමය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

**මහාචාර්ය අනුරාධ සෙනවිරත්න විසිනි**

මහා සංඝයා වහන්සේගේ කාර්යභාරය කුමක් ද යන්න නොයෙක් දෙනා නොයෙක් විට ප්‍රශ්න කරති. ඓතිහාසික වශයෙන් ගිහි සමාජයත් — සංඝ සමාජයත් අතර පැවැතියේ කෙබඳු සම්බන්ධතාවක්ද යන්නට ත්‍රිපිටකයෙන් ම කරුණු ගෙනහැර දක්විය හැක. ගිහි ජීවිතයත් පැවිදි ජීවිතයත් යනු දෙකක් මිස එකක් නොවේ. එහෙත් ආගමික අතින් බලන කල මේ දෙපක්ෂයම එකිනෙකාට තුන් අයුරකින් ළං වී ඇත. පළමුව ආගම ඇදහීමට සංඝයා වහන්සේ ගිහියනට අනුබල ලබා දුන්හ. දෙවැනිව සංඝයා වහන්සේ ස්වකීය ශික්ෂිත ජීවිතයෙන් ගිහියනට ආදර්ශයක් ලබා දුන්හ. තෙවැනි ව පැවිද්දෝ ගිහියන්ගේ ආගමික අනුශාසකයන් වශයෙන් ක්‍රියා කළහ. සංඝයා වහන්සේ ගිහියන් වෙතින් චීවර පිණ්ඩපාතය. සේනාසන, ගිලානපච්චය යන සිව්පසය බලාපොරොත්තු වුවත් ගිහියන් සමඟ ආර්ථික තරඟයක නිරත වූයේ නැත. එයට හේතුව ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉතා සීමා වීමයි. භික්ෂූන් ප්‍රතිපත්තියෙන් ඈත් වූ විට ඔවුන් විවේචනය කිරීමට ගිහියන්ට අවකාශ තිබුණි. ගිහියන්ගේ ගෞරව සම්මානයට හා බුහුමනට ගැළපෙන අයුරින් තමන්ගේ විනය පවත්වා ගැනීම සංඝයා වහන්සේගේ පරම යුතුකම විණි. තමන්ගේ හැසිරීම් ස්වභාවය අනුව ගිහියන් ශාසනය කෙරෙහි නංවා ගැනීමට සංඝයා වහන්සේට පුළුවන් විය. එසේ ම වැරදි කරන ගිහියනට ශාරීරික දණ්ඩනයෙන් තොර දඬුවම් පැමිණ වීමටත් හැකි විණි. සංඝයාගේ විනය සම්බන්ධයෙන් විවේචනයෙහි යෙදීමට ගිහියනට ඉඩ තිබුණද නිර්දෝශී භික්ෂූන්ට අවඥ කිරීම සැහැල්ලු කොට නො සලකන ලදී. එවැනි අවස්ථාවල ද එබඳු පුද්ගලයන්ගෙන් දනය පිළිගැනීමෙන් වැළකීමට සංඝයා මැළි වූයේ නැත. පිඬු සිඟා වැඩි කල දන් පිළිගන්වන අවස්ථාවෙහි පාත්‍රය යටිකුරු කොට අල්වා දනය ප්‍රතික්ෂේප කිරීම එම කාර්යය යි. මෙම දනය හැඳින්වූයේ **'පත්ත නික්කුජ්ජන කම්ම'** යනුවෙනි. හත්වැනි සියවසේ රජ කළ දඨොපතිස්ස රජතුමන්ට මෙම දඬුවම මහාවිහාරික භික්ෂූන් විසින් දෙනු ලැබ ඇත. එබැවින් ගිහි පැවිදි සම්බන්ධතාව විනය ආරක්ෂා කිරීමේ ගරුත්වය මත ම රඳා පැවැතියේය.

සංඝයා වහන්සේගේ හැසිරීම දහමෙහි අප්‍රසන්නවූවන් කෙරෙහි ප්‍රසාදය ඇති කිරීමටත් ප්‍රසනන හදවත් ඇතියවුන්ගේ ප්‍රසාදය වැඩි කිරීමටත් හේතු විණි. ''අප්පසන්නානං වා පසාදාය, පසන්නානං වා භීයොභාවාය'' යනුවෙන් මෙය භික්ෂු විභංගයේ විස්තර කර ඇත. වංචනික ජීවිතයක් ගත කිරීමත් ගිහියන්ගෙන් අයුතු ප්‍රයෝජන ගැනීමත් යන දෙක වලක්වාලීම පිණිසම භික්ෂු සමාජයේ විනය නීති සකස් වී ඇති වග මෙයින් පෙනී යයි.

ධර්මෝපදේශකයන් වශයෙන් භික්ෂූන්ගේ කාර්යභාරය වූයේ ධර්මය කියා දීමයි. ඒ වෙනුවෙන් ගිහියෝ සිවුපසයෙන් භික්ෂූන් පුදති. මහණෙනි, බොහෝ දෙනාගේ හිතසුව පිණිස, සතුට පිණිස ලෝකයා වෙනුවෙන් මෙත් සිතින් සැරිසරන්න යයි බුදුන් මුලදී ම භික්ෂු සංඝයාට අවවාද කළේ ඒ නිසාය.

බොහෝ දෙනා සිතන පරිදි ථෙරවාද බුදු සමය වූ කලී භික්ෂූන්ගේ ආරාමික ජීවිතයට පමණක් සීමා වූ දහමක් නොවේ. බුදුන් වහන්සේට ස්වකීය ජීවිතයේ මුල් කාලයේ දී මුණ ගැසුණ පුද්ගලයන් අතර තපස්සු–භල්ලුක යනු වෙළෙඳුන් දෙදෙනෙකි. පසුව යස හා ඔහුගේ දෙමාපිය ඇතුළු පිරිස හමු විය. ඉන් මාස කීපයකට පසු උන්වහන්සේට රජගහ නුවරට වැඩිය ගමනේ දී එහි ජීවත් වූ නාගරික පිරිස් හමු වූහ. අවුරුදු හතළිස් පහක් පමණ වූ ඉතිරි කාල පරිච්ඡේදයතුළ සමාජයේ විවිධ පුද්ගලයන් බුදුන් සරණ ගොස් ඇත. මගධයේ බිම්බිසාර – කෝසල නුවර පසේනදී යන දෙදෙනා එබඳු රජවරුන් වශයෙන් නම් කළ හැකිය. ක්ෂත්‍රියයන් හෝ වේවා බ්‍රාහ්මණයන් හෝ වේවා වෛශ්‍යයන් හෝ ශුද්‍රයන් හෝ වේවා බුද්ධ – ධම්ම – සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ යාමෙන් දහම වැළඳ ගත්හ. මේ පිළිවෙතට තිසරණ ගමනය යන නම ලැබුණි. ගිහි අනුගාමිකයන් කවුරු වුව ද උපාසක – උපාසිකා යනුවෙන් හඳුන්වනු ලැබූහ. ගිහියෝ එදිනෙදා ජීවිතයේ දී පන්සිල් පද ආරක්ෂා කළහ. මෙය සමාජයේ යහපත් දිවි පෙවෙතට මඟ පෑදී ය. සිඟාලෝවාද සූත්‍රයෙන් පැවැසෙන්නේ සමාජයේ සතුට හා සමාදනය බෙදා හදා ගන්නා ආකාරය යි. පරාභව සූත්‍රයෙන් දක්වෙන්නේ පුද්ගලයා පරිහානියට

පත්වන හේතුකාරක යි. මංගල සූත්‍රයෙන් උගත් වන්නේ මෙලොව හා පරලොව දියුණුව සලසා ගන්නේ කෙසේ දැ යි පැහැදිලි කිරීමයි. ජාතිය – කුලය – ජන්මය – සමාජ තත්වය යනාදී බාහිර ලක්ෂණයන්ට බුදු දහමින් තැනක් ලැබුණේ නැත. ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයෙන් හෙළිවන්නේ ගිහියෙකු වශයෙන් උභයාර්ථ සංසිද්ධිය සලසා ගන්නා අයුරුයි. ආර්ථික වශයෙන් ලාභ ලබන අයුරු ගැන අනාථ පිණ්ඩික සිටාණන්ට දේශනා කර ඇති සූත්‍රවලින් කරුණු හෙළි වේ. අවංකව ක්‍රියා කොට ධනය ඉපයීම වරදක් ලෙස බුදුන් සලකා නැත. වෙළඳාම් අතර වහල් ආයුධ – මාංශ – සුරා සහ වස විකිණීම පමණක් තහනම් කර ඇත. ධනය උපයා ගිහි ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු උන්වහන්සේ පැහැදිලි කර දී තිබේ. චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් පවසන්නේ දිළිඳු කම නිසා දුශ්ශීල භාවය අපරාධ සොරකම් හා මිනීමැරුම් ඇති වන හැටි ය. මේ සූත්‍ර දේශනාව අනුව රජෙකු කළ යුතු ප්‍රධානතම කාර්යය ත්‍යාගශීලී වීමයි. ඔහු ධනයට හා දේපලට තන්හා නොකොට ජනයාගේ ශුභසිද්ධිය සඳහා ඒවා යෙදිය යුතු ය.

බුදුන්වහන්සේ අවසාන අවුරුදු හතළිස් පහ ගත කොට ඇත්තේ බෙහෙවින් ම නගරවල ය. රජගහ, වේසාලි, සාවත්ථි යන නගර විශේෂ කොට ඇතිව, චම්පා, සාකෙත, කොසම්බි, බාරානසී යන නගර ඒ අතර සඳහන් වී ඇත. මේ ගමන්වල දී උන්වහන්සේට කෙබඳු පුද්ගලයන් මුණගැසී ඇත් ද? එක් උගතෙකු ථෙර හා ථෙරිගාථා පදනම් කරගෙන කළ පර්යේෂණයකට අනුව මේ ආකාරයට ප්‍රතිශක්කය හඳු ඇත. ථෙර–ථෙරි යන දෙ කොටස තුන සියයක් වශයෙන් ගෙන ඉන් තුනෙන් දෙකක් එනම් දෙසීයක් දෙනා සසුන්ගත ව ඇත්තේ නගර බදින් බව ඔහු පෙන්වා දී තිබේ. මෙයිනුත් 86% ක් සාවත්ථි, රාජගහ, කපිලවත්ථු හා වේසාලි කියන නගරවලින් පැමිණියෝ ය. කුල වශයෙන් ගත් කල 328 දෙනෙකුගෙන් 134 දෙනෙක් බ්‍රාහ්මණ වංශිකයෝ වූහ. එය ප්‍රතිශතයක් වශයෙන් ගතහොත් 40% ක් වේ. හැත්තෑපස් දෙනෙක් ක්ෂත්‍රියෝ වූහ. අනූඅට දෙනෙක් වෛශ්‍යයෝ වූහ. එකොළොස් දෙනෙක් ශුද්‍රයෝ වූහ. දහදෙනෙක් වසලයෝ වූහ. ඉඩම් හිමි, ධනවත් වෙළෙඳ පවුල්වලින් හා බලවත් පවුල්වලින් පැමිණි අයගේ සංඛ්‍යාව අධික වේ. බුදුන් වහන්සේගේ ධර්ම ප්‍රචාරයටත් භික්ෂු ශාසනයේ පැවැත්මටත් එහි අභිවෘද්ධියටත් අනුග්‍රහය ලැබුණේ ඒ ධනවත් හා බලවත් පාලක පවුල්වලිනි. එබැවින් දුප්පත් – ගම්බද අහිංසක ජනතාවට පමණක් බුදුනවහන්සේ ධර්ම දේශනා කළ බව හෝ අනුශාසනා කළ බව හෝ සිතීම වැරදි ය. නාගරික උසස් හා මධ්‍යම පන්තියේ දුක් දොම්නස් හා කලකිරීම් බුදු සසුන වැළඳ ගත් ඒ අයගේ හදවත් තුළින් මතු වූ බව සිතිය යුතු ය.

සමාජ ප්‍රශ්නවලට මැදිහත් ව ගෙවූ අතෘප්තිමත් ජීවිතයේ රාවය ථෙර–ථෙරි ගාථාවන්ගෙන් මතු වන බව තවත් ලෙසකින් කිව හැක.

බ්‍රාහ්මණ – ක්ෂත්‍රිය පාලනයට විරුද්ධව සටන් කළ වෛශ්‍ය හෙවත් ගොවි – වෙළෙඳ ජනයාගේ අනුග්‍රහය බුදු සමයේ අභිවෘද්ධියට ඉවහල් විය. ජේතවනාරාමය ගොඩ නගන ලද්දේ අනාථපිණ්ඩික සිටාණන් විසිනි. විසාකාව ද එබඳු දනපතිනියක් වූවා ය. බුදුන් දවස රජගහ නුවර පමණක් ආරාම දහ අටක් ද, වේසාලියේ හතරක් ද, සැවැත් නුවර තුනක් ද කෝසම්බියේ හතරක් ද වශයෙන් පැවැතියේ ය. එහෙත් මේ ආරාම පැවැතියේ පුද්ගල සන්තක දේපල වශයෙන් නොව භික්ෂු සංඝයා සන්තක වූ සාංඝික දේපල වශයෙනි. වෙනසකට තිබුණේ එයසියි.

බුදුන් වහන්සේ මිනිස් ජීවිතය දෙස බැලුවේ සමස්ත සමාජයම එකට ගෙන ආර්ථික දේශපාලන පසුබිමක සිට ය. මිනිස් ජීවිතය දෙස බලා උන් වහන්සේ දේශනා කළේ පළමුව, මිනිසා නිරන්තර යෙන් ම කාර්යශීලී උද්‍යෝගශීලී පුද්ගලයෙකු විය යුතු බව ය. දෙවනුව, තමන් උපයන ධනය ආරක්ෂා කර ගත යුතු බවය. තෙවනුව, උගත් – නැණවත්, සිල්වත් – අවංක හොඳ මිත්‍රයන් ඇසුරු කළ යුතු බව ය. සිව් වනුව, තමන්ගේ ආදායමට සරිලන පරිද්දෙන් වියදම් කළ යුතු බවය.

දේශපාලනඥයන් දෙස බැලූ උන්වහන්සේ රජෙකු පත් වන්නේ මහජනයාගේ ශුභසිද්ධිය සඳහා කටයුතු කිරීමට ඔහුට ඇති සුදුසුකම නිසා බව වදාළහ.

ශ්‍රී ලංකාව වූ කලී බුදුන් වහන්සේ දෙසූ දහමත් උන්වහන්සේ අනුගත් ගමන් මගත් පිළිගත් රටකි. ඒවා ක්‍රියාත්මක කිරීමට කැප වූ රටකි. ශ්‍රී ලංකාවේ පසු ගිය දෙදහස් පන්සිය වසරක බෞද්ධ ඉතිහාසය අප දකින්නේ බුදුන් වහන්සේ දෙසූ ධර්මය පිළිපදින ආරක්ෂා කරන මහා සංඝරත්නය වැඩ වසන රටක් වශයෙනි. ''මගේ ධර්මය ආරක්ෂා වන්නේ ශ්‍රී ලංකාවේ ය. එබැවින් විජය ඇතුළු පිරිසට ආරක්ෂාව සලසන සේ'' බුදුන් වහන්සේ විසින් ශක්‍රයාට කළ අවවාදය අපට මෙහිදී සිහිපත් වේ. විජය ඇතුලු පිරිස විසින් එද මේ දිවයිනේ ඇති කළ ජාතිය – සිංහල ජාතිය යි. එබැවින් සිංහල ජාතියේ පැවැත්ම බුද්ධ ශාසනයේ චිර පැවැත්මට හේතු වන බවභික්ෂූන් වහන්සේ දුටහ. ඒ අනුව උන්වහන්සේලා කටයුතු කළහ. රජුන්ගේ යුතුකම ජනයා ආරක්ෂා කොට බුදු දහම පෝෂණය කිරීම වුව ද භික්ෂුවකගේ උරුමය වූයේ සිංහල ජනතාවත් බුදු දහමත් ආරක්ෂා කිරීමය. බුදු දහම ආරක්ෂා කර ගැනීමට නම් ජාතිය ද ආරක්ෂා කර ගත යුතු ය යන සංකල්පයෙහි උන් වහන්සේලා

තරයේ එල්බ ගත්හ. දුටුගැමුණු රජතුමාගේ ව්‍යායාමය හා සංඝ රත්නයේ කාර්ය භාරය මහා වංශයේ විස්තර කර ඇති පරිද්දෙන් ම වටහා ගත හැක.

දුටුගැමුණු – සද්ධාතිස්ස සහෝදරයන් දෙදෙනා අතර පැවැති අමනාපයේ දී ගොඨගත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ ඉදිරිපත් ව සිත් තැවුල සංසිඳ වූ ආකාරයත් දුටුගැමුණු – එළාර යුද්ධයේ දී සංඝයා වහන්සේ සම්බන්ධ වූ ආකාරයත් අපට සිහිපත් වේ. සද්ධාතිස්සගෙන් පසු රජකම සඳහා ඔහුගේ වැඩිමහල් පුත් ලඤ්ජි තිස්ස සිටි නමුත් සංඝයා හා ඇමතිවරුන් රැස් ව අනුරාධපුර වාසී ථූලත්ථන පත් කර ගත් ආකාරය ද මෙහි දී සිහිපත් කළ යුතුය.

මහාතිස්ස ස්ථවිරයන් විසින් වළගම්බා ඔහුගේ සෙනෙවියන් අතර පැවැති අරගලය සංසිඳුවන ලදී. ධාතුසේන කුමරු හදවඩා රජකමට පුහුණු කරන ලද්දේ ද සංඝයා වහන්සේ නමක් විසිනි. දෙවන සේන රජු හා මිහිඳු යුවරජු අතර ගිවිසුම ඇතිවූයේ ද සංඝයා වහන්සේගේ මැදිහත් වීමෙනි. පස්වැනි සියවසේ දී පළමුවන මුගලන් රජුට සේනාව රැස් කිරීමට විහාරයක ඉඩ සලසා දුන්නේ ද භික්ෂු නමකි. කාශ්‍යප රජු යුදෙන් පැරද ගිය පසු මහා සංඝයා මහාවිහාරයේ දී උත්සවශ්‍රීයෙන් මුගලන් රජු පිළිගත් සැටිත් අමතක නොකළ යුතු ය. රජකම පවරන්නේ සංඝයා යන ප්‍රකාශය 10 වන සියවස වන විට ප්‍රසිද්ධියට පත්ව තිබුණේ ය.

ලක්දිව රජු ශාසනයේ ආරක්ෂකයා වූයේ ය. බුද්ධ ශාසනයේ ලෞකික නායකයා වශයෙන් ද ඔහු පෙනී සිටියේ ය. ක්ෂත්‍රියයකු රජකු වන්නේ බුදුන් වහන්සේගේ පාත්‍රය හා සිවුර රකින්නට බව 4 වැනි මිහිඳු රජු 10 වන සියවසේ දී පවසා ඇත.

භික්ෂූන් වහන්සේ දේශපාලනයට කෙළින් ම බලපෑම් නොකළහ. එහෙත් සංඝයා වහන්සේ ස්වකීය අභිප්‍රායන් ඉටු කරවා ගැනීමට හැකි රජවරුනට ආධාර උපකාර කර ඇත. රජවරුන් අතර මතභේද සංසිඳු වීම හා රජවරුන් තේරීමේ කටයුතු වලට ද සංඝයා වහන්සේ ඉදිරිපත් වූ අවස්ථා ඉතිහාසයෙන් පෙනේ.

රටේ නීතිය පිළිබඳ දැනුමත් අපක්ෂපාතී විනිශ්චයත් පිළිබඳ භික්ෂූන් වහන්සේ කෙරෙහි කෙතරම් විශ්වාසයක් තිබුණේ ද යත් මහාවිහාරවාසී ආභිධම්මික ගෝධගත්ත මහා ස්ථවිර කෙනෙක් භාතිය රජු විසින් අධිකරණ පදවියකට පත් කළ සැටිත් උන් වහන්සේගේ විනිශ්චයෙහි පිහිටා නොසිටින්නෙකුට රාජාඥාව කරවම් යි අණබෙර ලැවූ සැටිත් සමන්ත පාසාදිකා විනය අටුවාවේ සඳහන් වේ.

රජකම පවරන්නේ සංඝයා වහන්සේ ය යන ප්‍රකාශය පවා 10 වන සියවස වන විට ප්‍රචලිත ව තිබූ බව 5 වන කාශ්‍යපගේ අභයගිරි සෙල්ලිපියෙන් පෙනේ. පොළොන්නරුවේ රාජපදප්‍රාප්ත පළමුවන විජයබාහුගේ මරණින් පසු යුවරජුට රජකම පැවරුවේ ද භික්ෂු සංඝයාගේ අනුමැතිය ඇතිව ය. දෙවන මිහිඳු රජ රුහුණු රට සමග යුද වදින්නට කටයුතු නිමවා සියලු භික්ෂූන් ථූපාරාමයෙහි රැස් කරවා යුද්ධය සඳහා ඔවුන්ගේ අනුමැතිය ලබා ගත්තේය. ලක් රජය පැවැත්තේ බුදු සසුනෙහි යහපත පිණිස ය යන සංකල්පයෙහි පිහිටා රජවරු තම රාජ්‍යය සසුනට පිදූවෝ ය.

භික්ෂු ශාසනය තුළ ග්‍රන්ථ හා විදර්ශනා ධුරය නමින් ධුර දෙකක් ඇති විය. ග්‍රන්ථ ධුරය යනුවෙන් අදහස් වූයේ ධර්මය හැදෑරීම හා ඉගැන්වීම යි. විදර්ශනා ධුරය යනු භාවනා කිරීමයි. ග්‍රන්ථ ධුරය උසස් කොට සැලකුණේ බුද්ධි සම්පන්න දක්ෂ භික්ෂූන් එයට සම්බන්ධ ව සිටි නිසාවෙනුත් දුර්වල බුද්ධිහීන භික්ෂූන් භාවනානුයෝගී ව විදර්ශනා ධුරයෙහි නිරත වූ නිසාවෙනුත් බව අටුවා ග්‍රන්ථවලින් හෙළි වේ. ග්‍රන්ථ ධුරය වශයෙන් සැලකුණේ ඉගෙනීමත් ඉගැන්වීමත් ය. භාෂාව, ව්‍යාකරණ තර්ක ශාස්ත්‍ර වෛද්‍ය ශාස්ත්‍ර හා වෙනත් ශාස්ත්‍ර ද ග්‍රන්ථ ධුරයෙහි ලා සැලකුණ බව පෙනේ. මෙපරිද්දෙන් පැරණි ආරාමය අධ්‍යාපන හා සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පත් විය.

අනුරාධපුර සමයේ අග භාගය එනම් අට නවය හා දහවැනි සියවස් වන විට රටේ දේශපාලනය ඉතා වියවුල් තත්වයක පැවැතියේය. මෙකල ලක්දිව සතර වාරයක දී ම විදේශීය සතුරු හමුද ආක්‍රමණයන්ට ගොදුරු විය. මේ අතර පාණ්ඩ්‍යයන් වරක් ද, චෝලයන් දෙවරක් ද ආක්‍රමණය කර ඇත. මෙයින් ආක්‍රමණිකයන් තුන් වරක් පළවා හැරීමටත් දෙවරක් දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීමටත් සිංහලයනට හැකි විය. ක්‍රි.ව. 993 දී චෝල ආක්‍රමණයත් සමඟම අනුරාධපුර රාජධානිය බිඳ වැටී ගියේ ය. ඉන් ඉක්බිතිව සොළීහු අවුරුදු හැත්තෑහතක් ලක්දිව පාලනය කළහ. ඔවුන්ගේ අගනුවර බවට පත්වූයේ පොළොන්නරුව යි.

අනුරාධපුර සමයේ මැද භාගයේ සිට ම තුන් නිකායක් ගැන අසන්නට ලැබේ. ඒ නම් මහාවිහාරය, අභයගිරිය හා ජේතවන මහාවිහාර යන තුනයි. මීට අමතර ව තවත් නිකාය දෙකක් ගැන හත්වන සියවස වන විට අසන්නට ලැබේ. ඒවා ධම්මරුචි හා සාගලික වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ව්‍යාකූල දේශපාලන තත්වය ද බුදු සමයේ වර්ධනය කෙරෙහි බලපෑ බව සිතිය හැකි ය. අනෙක් අතට අනුරාධපුරයේ ප්‍රතිෂ්ඨාපනය වූ මුල් සඟ සසුන කාලයාගේ

ඇවැමෙන් පරිවර්තනයට ගොදුරු විය. අනුරාධපුර සමයේ අගභාගය වන විට භික්ෂූන් ද විනය අතින් පරිහානියට පත් වූ බවක් පෙනේ. ආරාමවල ධනය වර්ධනය වීමත්, භික්ෂුව සිංහල සමාජ සංවිධානය තුළ ගුරුවරයෙකු හා ආගමික නායකයෙකු ද වශයෙන් ඉටු කළ මෙහෙයට වඩා ඉඩම් හිමියෙකු වශයෙන් කටයුතු කිරීමත් කැපී පෙනුණේ ය. විහාර ගම් ගණන ක්‍රමයෙන් වැඩී ගියේ ය. ඥාති සම්බන්ධතා කෙරෙහි භික්ෂූන්ගේ අවධානය යොමු වූ බවට ද සෙල්ලිපිවලින් කරුණු හෙළි වේ. භික්ෂු විනයේ පරිහානිය 8, 9, 10 සියවස්වල රජවරු කිහිප දෙනෙකු විසින් ම පැන වූ කතිකාවත් වලින් මානාව පැහැදිලි වේ. දහවැනි සියවසේ 4 වැනි කාශ්‍යප රජු විසින් දුසිල්වත් මහණුන් සහ සසුනෙන් පළවා හැර ඇති බව පෙනේ. ශාසන ශෝධන ගැන 4 වැනි හා 5 වැනි කාශ්‍යප රජුන් දවස අසන්නට ලැබේ. පස්වැනි කාශ්‍යප රජු අභිධර්මයෙහි හසළ දැනුමක් ඇත්තෙකු විය. ඔහු දම්පියා අටුවා ගැටපදය ද රචනා කළේය පොළොන්නරුවේ පළමුවන පරාක්‍රමබාහු රජතුමා දිඹුලාගල කාශ්‍යප මාහිමියන්ගේ ද ආධාරයෙන් දුසිල්වත් මහණුන් සහ සසුනෙන් පළවා හැර සමගිය ඇති කෙළේ පිරිහෙමින් පැවති සහ සසුන මුදා ගැනීමේ පරමාර්ථයෙනි.

රාජකීය කටයුතුවල දී භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය වඩාත් ඉස්මතු වන අවස්ථා පොළොන්නරු සමයෙන් දැකිය හැකි ය. ගජබාහු හා පරාක්‍රමබාහු යන දෙදෙනා අතර පැවැති සටනවල දී ඔවුන් සංඝයා වහන්සේගේ අනුශාසනා පරිදි කටයුතු කළ ආකාරය **චූලවංශයේ** මෙන් ම **සංගමු විහාර සෙල් ලිපියෙන් ද** අනාවරණය වේ. යම් බලයක් රට පාලනය කළ රජතුමන්ට වී ද එවැනි ම බලයක් මහාසංඝයා වහන්සේට ද තිබුණ බව කිව හැකි බොහෝ සාධක අපේ ඓතිහාසික මූලාශ්‍රවලින් සොයා ගත හැක. තුන්වන උදය රජුගේ කාලයේ සිද්ධියක් මේ සඳහා නිදසුනක් වශයෙන් ගෙනහැර දැක්විය හැකි ය. නීතියේ රැහැනට අසු වූ මිනිසුනට විහාරයක දී අභයදානය දීම නිසා රජතුමාගේත් සංඝයා වහන්සේගේත් අතර ඇති වූ ආරාවුල මින් ප්‍රධාන තැනක් ගනී. පාංශුකූලික භික්ෂූන්ගේ තපෝවන භූමියේ සිට එම අපරාධකරුවන් යළි මුදා ගැනීමට රජතුමාට යුවරජු සමග එහි ගොස් භික්ෂූන් වහන්සේගේ විරුද්ධතාව මධ්‍යයේ ඔවුනට දඬුවම් දුන් සැටිත් අමනාපයට පත් භික්ෂූන් විහාරය අතහැර දමා රුහුණට ගිය සැටිත් **චූලවංශයේ** සඳහන් වේ. මේ බව දැනගත් යුද හමුදාවත් නගර වැසියෝත් රජතුමාට විරුද්ධ ව නැගී සිටියහ. දඬුවම් පැමිණ වූ රාජකීය නිලධරයන් මරා දැමූ උද්ඝෝෂකයන් යුවරජුට හා ආදිපාද වරයාට ද තර්ජනය කොට භික්ෂූන් ආපසු ගෙනවා ගන්නා ලෙස ඉල්ලා සිටියහ. මේ අවස්ථාවේ දී රජතුමා වුව ස්වකීය ජීවිතය බේරා ගත්තේ විහාරයක සැඟවී ගෙන ය. සංඝයා වහන්සේ මැදිහත් ව කැරලි කරුවන් සංසුන් කළහ. මහජනයා ඉදිරියේ රජතමා පරිභවයට ලක් කළ කැරලිකරුවෝ එම පාංශුකූලික භික්ෂූන්ගෙන් සමාව අයදින ලෙස රජුට බල කළෝය. සංඝයාගේ බලය එපරිදි විය.

පොළොන්නරුවේ පළමුවන විජයබාහු රජු ගේ (1070 — 1110) මහේෂිකාව කළ වරදක් සම්බන්ධයෙන් රජතුමා ක්‍රියා කළ ආකාරය ද **චූලවංශයේ** විස්තර වේ. මුලින් විස්තර කළ එම විහාර නිර්භය චාරිත්‍රය බින්දා වූ සිය මෙහෙසිය ගේ වරප්‍රසාද සියල්ල සුන් කොට ඇය ග්‍රීවයෙන් අල්ලා නුවරින් පිට කරවා මහ සඟරුවන සමා කරවා තමාගේ සංඝ ගෞරවය ලොවට පළ කළ බව එහි දැක්වේ. ස්වකීය මහේෂිකාවට විරුද්ධව මෙවැනි පියවරක් ගැනීමට තරම් රජ කෙනෙකු එඩිතර වූයේ සංඝයා වහන්සේගේ බලය හා උන වහන්සේලා කෙරෙහි මහජන ගෞරවය නිසා නොවේ යයි කාහට නම් තර්ක කළ හැකි ද?

පළමුවන විජයබාහු රජුගේ මරණින් පසු ඔහුගේ අභාවය පිළිබඳ පුවත එකල රෝහණයේ සිටි සිය පුත් වික්‍රමබාහුට දන්වා නොතිබුණි. එකල පොළොන්නරුවේ මූලායතනවල වැඩ සිටි භික්ෂූන් වහන්සේලා රජුගේ සොහොයුරිය හා රදළයන් ද සමඟ සාකච්ඡා කොට විජයබාහු රජ කමට පත් කළ සැටි අමතක කළ යුතු නොවේ. යුවරජ පදවියට වික්‍රමබාහුගේ අයිතිය ප්‍රතික්ෂේප කොට මාණාභරණ එම ධූරයට පත් කිරීම තවත් වැදගත් සිද්ධියකි. එම තීරණය වැරදි සහගත බවත් සම්ප්‍රදාය විරෝධී බවත් චූලවංශ කතු හිමියන් ම පවසතත් සංඝයාගේ බලය එබඳු යයි සිතනු විනා වෙන කළ හැකි දෙයක් නැත. එකී භික්ෂු උරුමය හා අයිතිය ලක්දිව බුද්ධ ශාසන ඉතිහාසය පුරාම සටහන් වී ඇත. එබැවින් ජාතියට හා රටටත් විපත්තිකාර අවස්ථාවන්හිදී ද දේශපාලන අරගල අවස්ථාවන්හිදී ද ස්වකීය වැටහෙන නුවණින් සංඝයා වහන්සේලා කරන ප්‍රකාශන හා අවවාදවල අයිතිය ගැන තර්ක කිරීමට කිසිවෙකුටත් අයිතියක් නැති බව අපට අපගේ ම සම්ප්‍රදායෙන් වැටහී යා යුතු ය. ''භික්ෂූන් දේශපාලනයෙන් ඈත් විය යුතුය'' යන්න කණපිට පෙරළා ගත් කියමනකි. භික්ෂූන් ක්‍රියා කරන්නේ පොදු ජන යහපතට විනා ස්වකීය යහපතට නොවේ. එබැවින් උන්වහන්සේලාගේ දේශපාලනය ජනයා සුබත මුදිත කිරීමයි. මේ සාම්ප්‍රදායික චාරිත්‍රයෙන් හා උරුමයෙන් භික්ෂූන් වහන්සේ ඈත් කොට තැබීමට යම් උත්සාහයක් මෑත කාලයේ දී වී නම් ඒ මිෂනාරී වරුන්ගේ උගැන්ම පිට යටත් විජිතවාදී පාලකයන් ගත් පියවරකි. අධිරාජ්‍ය වාදයට එරෙහි ව භික්ෂූන් වහන්සේ පෙරමුණ ගත් කල

ඔවුන් නිහඬ කර දොර අගුල්ලා විහාරාරාමවල සිර කොට තැබීමට ගත් පියවරකි. මෙය අප රටේ සිංහල බෞද්ධ උරුමයට සම්පූර්ණයෙන් ම පටහැනි ය.

භික්ෂූන් වහන්සේ හා රට පාලනය කළ රජතුමා අතර පැවැති සම්බන්ධතාව ගැන තවදුරටත් අවධානය යොමු කළ යුතු ය. බුද්ධ දේශනය අනුව බුදුන් වහන්සේ මෙන් ම චක්‍රවර්ති රජතුමාගේ තත්වයෙහිද අඩුවක් නොවී ය. දෙතිස් මහ පුරුෂ ලක්ෂණයෙන් හෙබි බුදුන් වහන්සේ මෙන් චක්‍රවර්ති රජතුමන් ද මහා පුරුෂයෙකි. මුළුමහත් සමාජ ක්‍රමයත් විශ්වයත් ක්‍රියාත්මක වූයේ රජතුමන්ගේ චර්යාව මත ය. ඔහුගේ පරිනිර්වාණය හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර ද බුදුන් හා සම වූයේ ය. එහෙත් පුරාණ සිංහල සමාජ ක්‍රමය යටතේ රජතුමන්ගේ තත්වය බුදුන් වහන්සේ හා සම නොවූව ද ඔහු අතිමානුෂික ගණයේ පුද්ගලයෙකු වශයෙන් සැලකිණ. බුදුන් වහන්සේ වෙනුවෙන් ඇප කැපවූ මේ ක්ෂත්‍රිය නායක රජවරුන් බොහෝ විට සැලකුණේ බෝසතුන් ලෙසට ය. තවත් ලෙස කින් කිවහොත් බුදු බව පතා පරාර්ථය යෙහි යෙදුණු දැහැමි බෝසතුන් ලෙසට ය. සිරිසඟබෝ, බුද්ධදාස, දෙවන උපතිස්ස, පළමුවන හා හතරවැනි අග්ගබෝධි හතරවැනි මිහිඳු ආදී බොහෝ රජවරුන්ගේ චරිතාප දානයන්ගෙන් මේ බව පැහැදිලි වේ. සිංහල රාජ පරම්පරාව ශාක්‍ය වංශයට සම්බන්ධ කර දැක්වීමට තරම් මහාවංශ කතුවරයා උනන්දු වූයේ සිංහල රාජ වංශයත් බුදුන් වහන්සේ අයත් වූ ශාක්‍ය වංශයත් අතර ඇති ඥාති සම්බන්ධතාව තහවුරු කිරීමට ය. ඔකාවස් රජ පරපුරෙන් පැවැත එන බවට පස්වැනි කාශ්‍යප වැනි රජවරුන් තමන්ගේ පරම්පරාව ගැන උදම් ඇනුවේ එබැවිනි. රජ කෙනකුන් වනාහි බුදුන් වහන්සේට බොහෝ සෙයින් සමාන වූ යුක්තිය හා මහජන සේවය සලසන කෙනකු වශයෙන් සැලකුණේ එබැවිනි. දැහැමි රජ කෙනකු ඇති වීම බුදු කෙනකුන් පහළ වීම බඳු සිද්ධියක් යයි දොළොස් වැනි සියවසේ දී නිශ්ශංකමල්ල රජු පැවසුවේ එ හෙයිනි.

පුරාණ ලංකාවේ රාජාභිෂේකයේ දී අනුගමනය කරන ලද සමහර චාරිත්‍ර බොහෝ සෙයින් බෞද්ධාගමික මුහුණුවරක් ගත්තේය. අභිෂේකය සඳහා ගත් පස්වර්ග හතෙන් පහක් ම සපයා ගෙන ඇත්තේ බෞද්ධ ආගමික ස්ථාන පහකිනි. පළමුවැනි විජයබාහු වැනි රජවරුන් ඔටුණු පැළඳුයේ සංඝයා වහන්සේගේ ඉල්ලීම පරිදි ශාසනය ආරක්ෂා කිරීමට ය. පෙර රජවරුන් රජ කමට පත් වූයේ රටවැසියා මෙන් ම බුද්ධ ශාසනයත් සංඝයා වහන්සේත් ආරක්ෂා කිරීම පිණිස ය. ශාසනය ආරක්ෂා කිරීම රජතුමන්ගේ යුතුකම බව නිශ්ශංකමල්ල රජතුමන් පැවසූයේ එබැවිනි. රජ කෙනකු පත් කිරීම මෙන් ම පළවා හැරීම කෙරෙහි වූව ද සංඝයා වහන්සේගේ බලය අසීමිත විය. සංඝයා වහන්සේ රජතුමන්ට අවනත විය යුතු යයි **විනය පිටකයෙහි** දැක්වෙතත් ලංකා ඉතිහාසයේ හැමවිට ම එය එලෙසින් ක්‍රියාත්මක නොවී ය. මහාවිහාරය සම්බන්ධයෙන් මහසෙන් රජතුමාගේ ක්‍රියා කලාපය භික්ෂූන් වහන්සේ නිසා වෙනස් වූ අයුරු **මහාවංශයෙන්** මනාව පැහැදිලි වේ. යුක්තියේ දී මිස අයුක්තියේ දී සංඝයා වහන්සේ රජතුමන්ට තබා කිසිවෙකුටත් අවනත නොවිය යුතු යයි බුද්ධඝෝෂ හිමියන් විනය අටුවාව වූ **සමන්තපාසාදිකාවෙහි** ''අඤ්ඤස්මිං ච ධම්මිකෙ කම්මේ අනුවත්ති තබ්බං අධම්මිකෙව පන න කස්ස ච අනුවත්තිතබ්බන්ති'' යයි සඳහන් කළේ මේ භික්ෂු අයිතිය නිසා විය යුතු ය.

මෙපරිදි සංඝයා වහන්සේගේ ආශීර්වාදය ලබාගත් රජතුමන් රට පාලනය කළේ සංඝයාත් ශාසනයත් ආරක්ෂා කිරීමේ ප්‍රතිඥා දෙමිනි. අවශ්‍ය අවස්ථා වන්හි දී උගත් සිල්වත් මහතෙර පාණන්ගේ අවවාද අනුශාසනා පරිදි ශාසන ශොධනයෙහි රජතුමන් නිරත වූයේ එබැවිනි. බුද්ධ ශාසන කටයුතු සංවිධානයේ ලා සිල්වත් නැණවත් මහ තෙරවරුන්ගෙන් හැම විට ම ඔහු අවවාද ලබා ගත්තේ ය. එසේ ම රජයේ ආදායමින් සෑහෙන ප්‍රමාණයක් මුදලක් ශාසනික කටයුතු සඳහා රජතුමා වියදම් කෙළේ ය. සංඝ ශාසනයේ පදවි පිරිනැමීම රාජ අනුග්‍රහය ඇතිව සංඝ සම්මුතියෙන් පමණක් සිදු වූවකි. පදවි පිරිනැමීම උගත් කම් මෙන් ම පාලන වගකීම් සංකේත වත් කිරීම සඳහා ද සිදු වී ඇත. මේ අනුව ''**භාණක**'' යන අභිධානය යටතේ උගත් ධර්මධර භික්ෂුහු දීඝභාණක, මජ්ඣිම භාණක, සංයුක්ත භාණක, ජාතක භාණක, වන වළා කියන, සූතත් වළා කියන, බිදම් වළා කියන හිමියන් ආදි ගෞරව නාමයෙන් පිදුම් ලැබූහ. ශාසන සංවිධාන යේ විවිධ වගකීම් භාර ඉසුලූ භික්ෂූන් නකා බලන හිමියන්, මහ හිමියන්, වෙහෙර හිමියන්, වත් හිමියන් ආදි නාමයන්ගෙන් හැඳින්වුණු බව ද පෙනේ.

භික්ෂූන් හා රජතුමන් අතර පැවති සම්බන්ධතාව දෙපක්ෂයට ම වාසිදායක විය. කෙසේ වුව ද රාජ්‍ය විචාලීම සඳහා සංඝයා වහන්සේගේ උපකාරය රජතුමන්ට බෙහෙවින් ම අවශ්‍ය විය. බොහෝ අවස්ථාවන්හි දී රජවරුන් මෙන් ම රාජ කුමාරවරු ද මහා සංඝයා වහන්සේගේ ඇසුර ලබමින් අධ්‍යාපන කටයුතු දියුණු කර ගත්හ. ගොඨාභය රජතුමා ස්වකීය පුතුන් දෙදෙනා සංඝමිත්ත හිමියන්ට භාර කෙළේ අධ්‍යාපනය ලබා දීමට ය. ධාතුසේන රජතුමා කුඩා කල සිට ම ආරක්ෂාව ලබමින් අධ්‍යාපනික කටයුතු වල නිරත වූයේ භික්ෂූන් වහන්සේ නමක් ඇසුරෙහි ය. මහනුවර රාජධානි සමයේ රාජාධි රාජසිංහ රජුන් අධ්‍යාපනය ලැබුවේ මොරතොට හිමියන් වෙතිනි. මේ නිසා සමහර රජවරු පුරාණ ලක්දිව උගතුන් හා ගත් කතුවරුන් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූහ. අධ්‍යාපනික කටයුතු නගාලීම සඳහා ඔවුන් විසින් පිරිවෙන් දියුණු කරන ලදී. සංඝයා වහන්සේත් රජ පවුලත් අතර ඇති වූ මේ සමීප සම්බන්ධතාව රජ පවුලේ ආරාවුල් සංසිඳු වීමටත් රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි සමහර අවස්ථාවල දී බලපෑම් ඇති කිරීමටත් හේතු විය. හතරවැනි කාශ්‍යප හා මහින්ද යුවරාජයන් අතර ඇති වූ අරගලයේ දී තුන් නිකායේ මහා සංඝයා වහන්සේ ඉදිරිපත් වූ ආකාරය මෙහි දී සිහිපත් කළ හැක. එසේ ම දුටුගැමුණු හා සද්ධාතිස්ස යන සහෝදරයන් දෙදෙනා අතර පැවති මත භේදය සංසිඳුවාලීමට මහා සංඝයා වහන්සේ ඉදිරිපත් වූ ආකාරය ද සිහිපත් කළ හැක. තුන්වන උදය රජුට විරුද්ධව මහජනයාත් යුද හමුදවත් එරෙහි වූ කල්හි එයින් ඔහු බේරා ගත්තේ ද මහා සංඝයා වහන්සේ ය. මේ වැනි තොරතුරු අපේ ඉතිහාසයේ සෑම රජ කෙනෙකු ම සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට තරම් ඓතිහාසික හා සාහිත්‍යගත සාධක ඇත. රාජ්‍ය තාන්ත්‍රික කටයුතු දියුණු කර ගැනීමේ දී භික්ෂු සංඝයා වහන්සේගේ කාර්ය භාරය ඉතා වැදගත් වූ වග බුරුම රටට පරාක්‍රම බාහු රජු විසින් වාචිස්සර හිමියන් යැවීමෙන් ද දහහතරවැනි සිය වසේ දී මහාසාමි කෙනෙකු විසින් සියම් රටට උපසම්පදාව ගෙන යාමෙන් ද මනාව පැහැදිලි වේ.

මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය වශයෙන් බෙදී පැවැති නිකාය හෙවත් ආයතන තුන පොළොන්නරු සමයේ මහ පැරකුම්බා රජු දවස එක්සත් වීමෙන් බිහි වූ නව සංඝ සමාජය ඉන් අනතුරුව එළැඹි කාලයේ දී ක්‍රමවත් සැලැස්මක් යටතේ විවිධ බාධක මධ්‍යයේ වුව ද පරිණාමයට පත් වූ අයුරු පැහැදිලිවේ.

මහනුවර රාජ්‍ය යුගයේත් අදත් මහනුවර මල්වතු–අස්ගිරි උභය මහා විහාරය ඇසුරු කොට ඇත්තේ එකී පුරාණ ලංකාවේ පැවැති මහාවිහාර වංශික සංඝ සංවිධානය යි. පොළොන්නරු සමයෙහි පටන් ග්‍රාම වාස හා ආරණ්‍ය වාස වශයෙන් ජීවත් වූ භික්ෂූහු **'මහාසාමි'** නමින් හැඳින්වුණු සංඝ නායක හිමිවරයකුගේ පාලනය යටතේ සසුන් ජීවිතය ගත කළහ. පිරිවෙන්වල අධිපති හිමියන් අතරින් ආයතනාධිපති හිමිවරුන් **(අයතැන් නායක)** තේරුණ අතර ආයතනාධිපති හිමිවරු අතරින් **වාසාධිපති** හිමිවරුන් දෙදෙනෙකු ද ඒ දෙදෙනා අතරින් මහාසාමි හෙවත් **ප්‍රධාන සංඝනායක** හිමි නමක ද තේරී පත් විය. යතිරාජ, යතිස්සර යන පාලි වචනවලින් ද **එළු අත්තනගලු වංශයේ "සියලු යතිගණයාට සංඝරාජ ධුරන්ධර"** යනුවෙන් ද සඳහන් වන්නා වූ පදවිය මහාසාමි පදවියම දැයි තවදුරටත් විභාග කළ යුතුය. මහාසාමි පදවිය යටතේ ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී භික්ෂු සංඝයා වෙනුවෙන් මහතෙර පදවි දෙකක් පැවැතියේ ය. මහාසාමි පදවිය සංඝරාජ පදවිය හා සමාන කොට ගතහොත් එම ධුරය හිස් වූ කල ඒ සඳහා කෙනකු පත් වූයේ මහතෙරුන් දෙදෙනාගෙන් කෙනෙකි. මහතෙර පදවිය සඳහා කෙනකු තෝරා පත් වූයේ තුන් රජයේ මහා සංඝයා වහන්සේ ගේ අනුමැතියෙනි. මෙසේ පත් වූ මහතෙරුන්ට ශ්‍රී ලංකේශ්වර මහරජතුමන් විසින් වන්දනාමාන කිරීමෙන් හා ගරු සම්මාන පිදීමෙන් එම තනතුර නිත්‍යානුකූල කළ බව **කතිකාවත් සහරාවෙන්** මනාව පැහැදිලි වේ. එසේ ම ග්‍රාම හා ආරණ්‍ය වශයෙන් වූ උභය විහාරයේ වැදගත් කටයුතු සාකච්ඡා කිරීමටත් ප්‍රශ්න සම්බන්ධයෙන් තීරණ ගැනීමටත් එක් විහාරයක් සඳහා මහතෙරුන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් කාරක මහා සංඝ සභාවක් රැස් වූ බවට ද තොරතුරු **නිකාය සංග්‍රහයෙන්** ලැබේ. දඹදෙණි සාසන ශෝධන කටයුතුවල දී මෙම කාරක සංඝ සභාව එක් රැස් වූ අයුරු එයින් පැහැදිලි වේ.

මහනුවර මල්වතු – අස්ගිරි උභය මහාවිහාරීය ග්‍රාමවාස හා ආරණ්‍ය වාස සංඝ පරම්පරාවේ අවිච්ඡින්න වූ මූලස්ථාන දෙක වශයෙන් හඳුන්වා දීමට සිදු වේ. ග්‍රාම වාස හා ආරණ්‍ය වාස භේදය මහනුවර රාජධානි සමයේ මුල් භාගයේ දී ම පාහේ අභාවයට

ගිය නමුත් එම විහාර දෙක වෙන් වශයෙන් තම කටයුතු තවදුරටත් කර ගෙන ගියේ ය.

සංඝ සංවිධානය හා පරිපාලනය සම්බන්ධයෙන් අද දින වුවත් මහාවිහාර වංශික මල්වතු අස්ගිරි උභය විහාරයේ පවතින්නේ පුරාණ ලංකාවේ පැවැති ඒ සම්භාවනීය සම්ප්‍රදායම බව කිව යුතු ය. එම මහා විහාර සම්ප්‍රදය දැන් **ස්‍යාමෝපාලි නිකාය** වශයෙන් හඳුන්වා දීම නම් යුක්ති යුක්ත නොවන්නේ දහතර වැනි සියවසේ සියම් දේශයට උපසම්පදව ලබා දීමෙන් එහි බුද්ධ ශාසනය බේරා දුන් මහාවිහාර වංශික සිංහල භික්ෂූන් වහන්සේ යලි දහඅට වන සියවසේ බුද්ධ ශාසනය ආරක්ෂා කරගැනීම පිණිස සියම් රටින් උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ ගෙන්වා උපසම්පදව පිහිටුවා ගැනීම පමණක්ම හේතුවීමයි. කරුණු මෙසේ හෙයින් මල්වතු – අස්ගිරි උභය විහාරය වූ කලී **මහාවිහාර වංශික මහා නිකාය** වශයෙන් පමණක් හඳුන්වා දීම ඓතිහාසික වශයෙන් යෝග්‍ය බව සඳහන් කරමි.

පෙර රජ දරුවන් දවස ජාතික ආගමික ප්‍රශ්නවල දී මහා සංඝයා වහන්සේ පෙරමුණ ගෙන ක්‍රියා කළහ. උන්වහන්සේ දුන් අවවාද හා අනුශාසනා රජයත් මහ ජනතාවත් පිළිගත්තේ ද උන්වහන්සේලා කෙරෙහි තිබූ දැඩි ශික්ෂණයත් විනයගරුකත්වයත් තීක්ෂණ බුද්ධිය හා ඥානයත් යන කරුණු පදනම් කොට තැබූ විශ්වාසය නිසා ය. දැනුම හා ශික්ෂණයෙන් තොර පැවිදි ජීවිතයක් ගැන සිතීම පවා උගහටය. එවැනි ගුණාංග යන්ගෙන් පරිපූර්ණ භික්ෂුවකගේ අවවාදය කිසිසේත් ඉවත ලිය නොහැක. සමාජයට හැම අතින් ම මාර්ගෝපදේශකත්වය දීමට තරම් සංඝයා වහන්සේ එඩිතර විය යුතු ය. එපරිද්දෙන් ම එම අනුශාසනා සමාජය විසින් පිළිගනු ලැබීමට හැකිවන පරිද්දෙන්ම උන් වහන්සේලා දැන උගත්කමින් පරිපූර්ණ විය යුතු ය. ඒ සියල්ලටත් වඩා ශික්ෂණයෙන් හා විනය ගරුකත්වයෙන් උත්තරීතර විය යුතු ය. සිව්පසය සපයා භික්ෂූන් වහන්සේ ජීවත් කරන දයකයාගේ සිත රිදවීම ද නොකොට යුතුය. මෙබඳු අදහස් නිරූපණය කරමින් ධම්මපදයේ (භික්ඛුවග්ග) එන ගාථාවක් උසස් භික්ෂු ජීවිතය අගයන්නේ මෙසේ ය :

> ''යම් භික්ෂුවක් ළදරු වුවත් බුදු සස්නෙහි මනාව යෙදේ ද ඔහු වලාකුලින් නික්මුණු පුන්සඳ මෙන් මේ ලොව බබළයි'' යනුවෙනි.

මල්වතු මහා විහාරීය අනුනායක පදවිය ප්‍රදනය කිරීමේ ඉපැරණි සන්නසක ඡායාරූප පිටපතක්

